# ඌව පළාත් මුල් ළමාවිය සංවර්ධන ප්‍රමිති



මුල් ළමාවිය සංවර්ධන අධිකාරිය

ඌව පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය

# පටුන


හැඳින්වීම…………………………………………………………………………………………………………III

දැක්ම, මෙහෙවර, අරමුණ………………………………………………………………………………………IV

අධ්‍යාපන ලේකම්ගේ පණිවිඩය……………………………………………………………………………V

නිසිබලධාරිතුමාගේ පණිවිඩය……………………………………………………………………………VI

1 ළමා සංවර්ධන ප්‍රමිති ........................................................................................ 1

1.1 ළමා සංවර්ධන ප්‍රමිතියට අදාළ සංවර්ධන අංශ ........................................................ 1

I. කායික සංවර්ධනය ............................................................................................ 1

II. සමාජීය හා චිත්තවේග සංවර්ධනය ........................................................................ 1

III. ප්‍රජානන සංවර්ධනය ......................................................................................... 1

IV. භාෂාව හා මූල් කාලීන සාක්ෂරතා සංවර්ධනය ......................................................... 1

2 ගුරු සංවර්ධන ප්‍රමිති .......................................................................................... 2

2.1 ගුරු සංවර්ධන ප්‍රමිතියට අදාළ සංවර්ධන අංශ ........................................................ 2

I. ගුරුවරයෙකු වශයෙන් පෞද්ගලික මෘදුකුසලතා (Soft skills) අත්පත් කරගැනීමේදී පහත සඳහන් හැකියා එහි ප්‍රදර්ශනය කරයි. ........................................................................ 2

II. ගුරුවරයෙකු වශයෙන් වෘත්තීය කුසලතා අත්පත් කර ගැනීමේ දී පහත සඳහන් හැකියා ප්‍රදර්ශනය කරයි. ........................................................................................................ 2

III. ගුරුවරයෙකු වශයෙන් ඉගෙනුම් ඉගැන්වීම ක්‍රියාවලිය පිළිබඳ කුසලතා අත්පත් කර ගැනීමේ දී පහත සඳහන් හැකියා ප්‍රදර්ශනය කරයි.. ..................................................................... 3

IV. මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන කළමණාකරණය සහ පරිපාලන කුසලතා අත්පත් කර ගැනීමේ දී පහත සඳහන් හැකියා ප්‍රදර්ශනය කරයි ......................................................... 3

3 භෞතික සංවර්ධන ප්‍රමිති ....................................................................................... 4

3.1 භූමිය හා පිහිටීම ................................................................................................ 4

3.2 ගොඩනැගිල්ල .................................................................................................... 5

3.3 ඉඩකඩ : ............................................................................................................ 6

3.4 ජලය සහ සනීපාරක්ෂක පහසුකම් ........................................................................... 7

3.5 ළමා මේස, පුටු හා වෙනත් උපකරණ සැකසීමේදී අනුගමනය කළ යුතු ප්‍රමිතිය ..................... 7

I. මේසය : ............................................................................................................ 7

II. පුටුව : ............................................................................................................. 7

III. වෙනත් උපකරණ : ............................................................................................. 7

IV. සෙල්ලම් මිදුල .................................................................................................. 8

ආශ්‍රිත ග්‍රන්ථ හා ලේඛන නාමාවලිය………………………………………………………………………11

මුල් ළමාවිය සංවර්ධන ප්‍රමිති සකස් කිරීමේ සම්පත් දායකත්ව මණ්ඩල නාමලේඛනය…………………………12

# හැඳින්වීම

රටක සංවර්ධනය කෙරෙහි භෞතික සම්පත් අභිභවා මානව සම්පතේ ගුණාත්මකභාවය හේතු වේ. මානව සම්පතේ ගුණාත්මක භාවයේ පදනම අධ්‍යාපාන ක්‍රියාවලියයි. මේ අනුව ශ්‍රී ලාංකීය ජන සමාජය තුළ මුල් ළමාවිය දරුවන්ගේ ගුණාත්මකභාවය තහවුරු කිරීම සඳහා මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන බිහිවෙමින් , තහවුරු වෙමින් , වර්ධනය වෙමින් පවතී.මේ අනුව මුල් ළමාවිය සංවර්ධනය හා අධ්‍යාපන ක්‍රියාවලිය වශයෙන් ජාතික මට්ටමේ ප්‍රතිපත්ති හා ප්‍රමිති සකස් කර ඇත.

මෙලෙස මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන ඇසුරින් ක්‍රියාත්මකවන භෞතික හා මානව සංවර්ධන ක්‍රියාවලිය ශක්තිමත් කිරීම ඌව පළාත් මුල් ළමාවිය සංවර්ධන අධිකාරිය සතු කාර්යභාර්ය වේ. මේ සඳහා මූලික දායකත්වය ලබා දෙන්නේ මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථානවල ගුරුවරුන් සහ භාරකරුවන්ය. ඌව පළාතේ මුල් ළමාවිය සංවර්ධනය කේන්ද්‍ර කරගනිමින් රාජ්‍ය සහ රාජ්‍ය නොවන ආයතන මුල් ළමාවිය සංවර්ධන අධිකාරියේ සම්බන්ධීකරණයෙන් යුතුව ඒකාබද්ධ ප්‍රවේශයකින් කටයුතු කරයි.

පසුගිය කාලය තුළ ඌව පළාතේ මුල් ළමාවිය සංවර්ධනය සඳහා භෞතික හා මානව ප්‍රමිතීන් සකස් කර නොතිබූ හෙයින් 2014 අංක 2 දරණ ඌව පළාත් මුල් ළමාවිය සංවර්ධන ප්‍රඥප්තියට අනුව පළාතේ මුල් ළමාවිය සංවර්ධනය වෙනුවෙන් සහය දක්වන සියලු රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතනවල අදහස් හා මූලාශ්‍ර අධ්‍යයනය කරමින් පළාතේ මුල් ළමාවිය දරුවන් සඳහා මෙම භෞතික හා මානව ප්‍රමිතීන් සකස් කරන ලදී.

# දැක්ම

ප්‍රීතිමත් හා සෙල්ලක්කාර මුල් ළමාවිය හරහා නිසි දරුවා

# මෙහෙවර

රාජ්‍ය, රාජ්‍ය නොවන සහ පෞද්ගලික ආයතන සමග එලදායී ළමා ඉගෙනුම් පෝෂණය කිරීම පාසල් ගුරුවරුන්ගේ කුසලතා වර්ධනය , ශාරීරික හා මානසික සංවර්ධනය තුළින් ඔවුන්ගේ මුල් ළමාවිය සියලු දරුවන්ගේ මූලික කුසලතා සංවර්ධනය කිරීම, මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන සඳහා මූලික භෞතික පහසුකම් සැපයීම සඳහා සහයෝගයෙන්, පවුල් පදනම් ළමා සංවර්ධන වැඩසටහන් ප්‍රවර්ධනය කිරීම හා මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන නියාමනය.

# අරමුණ

දරුවකුගේ මුල් ළමාවිය වශයෙන් සැලකෙන වයස අවුරුදු පහ සම්පූර්ණ වන තෙක් කාලසීමාව තුළ මුල් ළමාවිය සංවර්ධනය සඳහාත්, නිසිමඟ පෙන්වීම සඳහාත් සුදුසු හා යෝග්‍ය නෛතික, ආයතනික හා පරිපාලනමය ව්‍යුහයක් ගොඩනැගීම.

# අධ්‍යාපන ලේකම්ගේ පණිවිඩය

රටක සංවර්ධන ක්‍රියාවලියේ පදනම වන්නේ ගුණාත්මක අධ්‍යාපනයයි. ඒ සඳහා කළමණාකරණ ක්‍රියාවලියේ ගුණාත්මක බව තහවුරු කිරීම විශේෂයෙන් අවශ්‍ය වෙයි. මෙරට පෙර පාසල් පද්ධතියට යෙදවුම් වශයෙන් යොමු කරන මානව හා භෞතික සම්පත් නිසි ප්‍රමිතියෙන් යුතුව කළමනාකරණය කරන්නේ නම් ගුණාත්මක බව රැකගැනීමට හැකි වේ. ඒ සඳහා අවශ්‍ය ප්‍රථම කාර්ය වූ පෙර පාසල් සංවර්ධනය පදනම් කරගත් ළමා හා භෞතික ප්‍රමිති පෙර පාසල් ගුරුවරයෙකු සංවර්ධනය කරගත යුතු පොදු හා විශේෂ නිපුණතා මෙම ග්‍රන්ථයෙන් ඉදිරිපත් කර තිබීම ගැන මම සතුටට පත් වෙමි.

සෑම පෙර පාසලක ම ඇගයීමට ලක්විය යුතු සියලු ම අංශ ප්‍රධාන ක්ෂේත්‍ර 03ක් යටතේ ආවරණය කරමින් ගුරු ළමා භෞතික ප්‍රමිති, දර්ශක පාදක ඇගයීම් නියාමන යාන්ත්‍රණයක් අධ්‍යාපන පද්ධතිය තුළ ස්ථාපිත කිරීමෙන් පෙරපාසල් ගුරුවරුන් ඇතුලු කළමණාකරණ මණ්ඩලවලට නිවැරදි තීරණ ගැනීමට හැකිවන අතර සියලු ම පෙර පාසල්වල ඉගෙනීම ලබන දරුවන්ට සම අධ්‍යාපන අවස්ථා ලබාදීමටත්, සම්පත් කාර්යක්ෂමතාවය ඇති කිරීමටත් මේ නිසා පහසුව සැලසේ.

එසේ ම මෙම ග්‍රන්ථයේ හඳුන්වා දී ඇති ළමා ප්‍රමිති, ගුරු ප්‍රමිති හා භෞතික ප්‍රමිති සංවර්ධනය කර ගැනීමට හා අදාළ තත්ත්ව සංරක්ෂණ ක්‍රියාවලියකට පෙර පාසල් ගුරුවරුන් හා නිලධාරීන් නැඹුරුවීමෙන් පෙර පාසල් කළමණාකරණ මණ්ඩල ශක්තිමත් කිරීම, ආයතනික ගුණාත්මක තත්ත්වයන් වර්ධනය වීම, කළමණාකරණ හා ගුරු වෘත්තීය ධාරිතා සංවර්ධනය වීම, පෙර පාසලේ ප්‍රබලතා හඳුනාගැනීමට පෙර පාසල් ප්‍රජාවට අවස්ථාව ලැබීම වැනි වාසි රාශියක් අත්පත් කර ගැනීමට හැකිවෙයි.

එබැවින් සියලු ම පෙර පාසල් ගුරුවරුන් පෙර පාසල් කළමණාකරණ කමිටු සහ නිලධාරීන් ද නිසි ප්‍රමිතියකින් යුක්තව තම රාජකාරී කටයුතුවල නිරත වීම මගින් සිසුන්ට වඩා ගුණාත්මක අධ්‍යාපනයක් ලබාදීමට කැපවිය යුතු කාලය එළඹ ඇතැයි ප්‍රකාශ කරමි. ඒ සඳහා මෙම ග්‍රන්ථයේ අදාළ උපදෙස් මැනවින් පරිශීලනය කොට “ගුණාත්මක සමාජයක් සඳහා ගුණාත්මක අධ්‍යාපනයක් ” යන දැක්ම යථාර්ථයක් බවට පත් කිරීමට අවශ්‍ය පියවර ගැනීමට මඟ පෙන්වීම ගැන මුල් ළමාවිය සංවර්ධන අධිකාරියේ කළමණාකරණයට හා ඒ වෙනුවෙන් කැප වූ සියලු දෙනාට ස්තුතිය පළ කරමි. එසේම මුල් ළමාවිය සංවර්ධන නිලධාරීන්, මුල් ළමාවිය ගුරුවරුන්, ප්‍රධාන පාසලේ ගුරුපදේශකයින්, ව්‍යාපෘති නිලධාරීන්, පවුල් සෞඛ්‍ය සේවා නිලධාරින්, සෞඛ්‍ය කළමණාකාරභවතුන්, ළමා හිමිකම් ප්‍රවර්ධන නිලධාරීන් යන සියලු දෙනාගේ දායකත්වය ලබාගනිමින් දැරූ සමූහික ප්‍රයත්නය අගය කරන අතර, හඳුනාගත් ප්‍රමිති දර්ශක හා නිපුණතා ඵලදායි ලෙස භාවිතා කරමින් පෙර පාසල් අධ්‍යාපනයේ ගුණාත්මක තත්ත්වය රක්ෂණය කරගැනීම සියලු ම අධ්‍යාපන නිලධාරීන්ගේ වගකීම බව ද ප්‍රකාශ කරමි.

# නිසි බලධාරිතුමාගේ පණිවිඩය

දරුවෙකුගේ මුල් ළමාවිය වශයෙන් සැලකෙන වයස අවුරුදු පහ සම්පූර්ණ වන තෙක් කාලසීමාව තුළ ළමාවිය සංවර්ධනය සඳහාත් නිසි මඟ පෙන්වීම සඳහාත් වූ පරමාර්ථයන් ඉටු කර ගැනීම සඳහා සුදුසු යෝග්‍ය නෛතික, ආයතනික හා පරිපාලනමය ව්‍යුහයක් ගොඩනැගීම ප්‍රඥප්තියේ අරමුණ වන්නේ ය.

ගුණාත්මක බවින් පිරිපුන් සමාජයක් බිහිකිරීමේ පළමු සංධිස්ථානයක් ලෙස මුල් ළමාවිය හැඳින්විය හැකිය. අවුරුදු 3-4 දරුවන්ගේ මුල් ළමාවිය අධ්‍යාපනය ගුණාත්මක බව තහවුරු කිරීමේ දී මුල් ළමාවිය ප්‍රමිතීන් ඉතා වැදගත්ය. එබැවින් ළමා ලේකම් කාර්යාලය මගින් සකස් කරන ලද ළමා ප්‍රමිතීන් සහ ඌව පළාත් මුල් ළමාවිය සංවර්ධන අධිකාරිය මගින් සකස් කරන ලද ගුරු සංවර්ධන සහ භෞතික සම්පත් සංවර්ධන ප්‍රමිතීන් ක්‍රියාත්මක කිරීම තුළින් පළාතේ සියලු ම මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථානයන් හි ගුණාත්මක සංවර්ධනය ඇති කිරීම අපගේ අරමුණයි. මෙම ප්‍රමිතීන් ක්‍රියාත්මක කිරීම තුළින් මුල් ළමාවිය ගුරුවරුන් වෘත්තිය අනුව ඉහළ තලයකට ගෙන ඒම මෙන්ම මධ්‍යස්ථාන තුළ බලාපොරොත්තු වන ඉලක්ක කරා ළඟා විය හැකිය. මුල් ළමාවිය නිලධාරීන්ගේ අධීක්ෂණය තුළින් පියවරින් පියවර ඉදිරි දැක්ම පෝෂණය කර ගැනීමට ද හැකි වෙනු ඇත. තව ද දරුවන්ගේ නිපුණතා වර්ධනය කරලීමත් එක් අරමුණකි.

අප සියලු දෙනාගේ ම අරමුණ වනුයේ කිසිදු භේදයකින් හා වර්ග කිරීමකින් තොරව පළාතේ සෑම පෙරපාසලක් ම සංවර්ධනය කිරීමයි.

<u>ඌව පළාතේ මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන සඳහා ප්‍රමිති ඇතුළත් වන ප්‍රධාන ක්ෂේත්‍ර</u>

1. ළමා සංවර්ධන ප්‍රමිති
2. ගුරු සංවර්ධන ප්‍රමිති
3. භෞතික ප්‍රමිති

# 1 ළමා සංවර්ධන ප්‍රමිති

## 1.1 ළමා සංවර්ධන ප්‍රමිතියට අදාළ සංවර්ධන අංශ

***I. කායික සංවර්ධනය***

***II. සමාජීය හා චිත්තවේග සංවර්ධනය***

***III. ප්‍රජානන සංවර්ධනය***

***IV. භාෂාව හා මුල් කාලීන සාක්ෂරතා සංවර්ධනය***

ළමා ලේකම් කාර්යාලයේ මුල් ළමාවිය සංවර්ධනයට අදාළ ජාතික කමිටුවේ සියලු සාමාජිකයන්ගේ ප්‍රධානත්වයෙන් 2015 නොවැම්බර් 19 වන දින ළමා සංවර්ධන හා කාන්තා කටයුතු අමාත්‍යාංශයේ ළමා ලේකම් කාර්යාලය මගින් එළි දක්වන ලද වයස අවුරුදු 3-5 ත් අතර දරුවන් සඳහා සකසන ලද මුල් ළමාවිය සංවර්ධන ප්‍රමිතීන් ඌව පළාත් මුල් ළමාවිය සංවර්ධන අධිකාරිය මින් මතුවට ළමා සංවර්ධන ප්‍රමිතීන් ලෙස පිළිගනු ඇත. (එයට අදාළ ප්‍රමිති මේ සමග අමුණා ඇත. - ඇමුණුම් අංක 01)

# 2 ගුරු සංවර්ධන ප්‍රමිති

## 2.1 ගුරු සංවර්ධන ප්‍රමිතියට අදාළ සංවර්ධන අංශ

1. මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන ගුරුවරයෙකු වශයෙන් පෞද්ගලික මෘදු කුසලතා (Soft skills) ප්‍රදර්ශනය කරයි.
2. මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන ගුරුවරයෙකු වශයෙන් වෘත්තීය කුසලතා අත්පත් කරගැනීමේ දී පහත සඳහන් හැකියා ප්‍රදර්ශනය කරයි.
3. මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන ගුරුවරයෙකු වශයෙන් ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය පිළිබඳ කුසලතා පිළිබඳ කුසලතා ප්‍රදර්ශනය කරයි.
4. මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන ගුරුවරයෙකු වශයෙන් කළමණාකරණය හා පරිපාලන කුසලතා ප්‍රදර්ශනය කරයි.

### *I.* ගුරුවරයෙකු වශයෙන් පෞද්ගලික මෘදුකුසලතා *(Soft skills)* අත්පත් කරගැනීමේ දී පහත සඳහන් හැකියා එහි ප්‍රදර්ශනය කරයි.

- ශක්තිමත් වෘත්තීය ආචාරධර්මවලින් යුක්තව කටයුතුකිරීම. (උදා - ඇඳීම, පැළඳීම, ගමන් කිරීම, කථාව වැනි)
- ධනාත්මක ආකල්පවලින් යුක්තව කටයුතු කිරීම.
- මනා සන්නිවේදන කුසලතාවයකින් කටයුතු කිරීම.
- කාලය මනා ලෙස කළමණාකරනය කරගනිමින් කටයුතු කිරීම.( උදා- දිනපතා පැමිණීම, නියමිත වේලාව තුළ සේවයේ යෙදීම යනාදිය.....)
- ගැටලු විසඳාගැනීමේ කුසලතාවලින් කටයුතු කිරීම.
- හොඳ කණ්ඩායම් සාමාජිකයෙකු වශයෙන් කටයුතු කිරීම.
- ආත්ම විශ්වාසයෙන් අභියෝගවලට මුහුණ දීමේ හැකියාව.

### *II.* ගුරුවරයෙකු වශයෙන් වෘත්තීය කුසලතා අත්පත් කර ගැනීමේ දී පහත සඳහන් හැකියා ප්‍රදර්ශනය කරයි.

- මුල් ළමාවිය සංවර්ධනයට අදාළව වසරකට නොඅඩු පිළිගත් ඩිප්ලෝමා පාඨමාලාවක් හදාරා තිබීම.
- මුල් ළමාවිය සංවර්ධනයට අදාළ සෞන්දර්ය පුහුණු පාඨමාලාවක් හදාරා තිබීම.
- දැනුම යාවත්කාලීන කරන පුහුණු වැඩසටහන් සඳහා සහභාගී වී සිටීම.
- ඉගෙනුම් කව පිළිබඳව පුහුණුවීම් ලබා තිබීම.
- ළමා ආරක්ෂණය පිළිබඳව පිළිගත් පුහුණුවීම් හා පාඨමාලා හදාරා තිබීම.

- ❖ භාෂාව, තාක්ෂණය, මෙවලම් භාවිතය හා සමාජ ඒකාග්‍රතාවය පිළිබඳව ගුරුවරයා සතු හැකියාව.

## III. ගුරුවරයෙකු වශයෙන් ඉගෙනුම් ඉගැන්වීම ක්‍රියාවලිය පිළිබඳ කුසලතා අත්පත් කර ගැනීමේ දී පහත සඳහන් හැකියා ප්‍රදර්ශනය කරයි.

- ❖ පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය / මුල් ළමාවිය සංවර්ධන අධිකාරියේ අනුමත විෂය නිර්දේශ හා වැඩ පැවරුම් අනුව කටයුතු කරයි.
- ❖ දරුවන්ගේ කායික හා මානසික උත්තේජනයන්ට ගැළපෙන ලෙස ඉගෙනුම්, ඉගැන්වීම් ක්‍රියාවලිය සැලසුම් කොට ක්‍රියාත්මක කිරීම.
- ❖ දෛනික,සති, මාසික ,වාර්ෂික සැළසුම්වලට අනුව කටයුතු කරයි.
- ❖ උචිත ඉගෙනුම් ඉගැන්වීම් උපකරණ , ඉගැන්වීමේ ක්‍රියාවලිය සඳහා භාවිතා කරයි.
- ❖ ළමයින්ගේ සාධන මට්ටම් ඇගයීමේ දී විධිමත් ඇගයීම් ක්‍රියාවලියකට අනුව කටයුතු කරයි.
- ❖ මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථානවල සංස්කෘතික සහ අනෙකුත් උත්සවවල දී මානව හා භෞතික සම්පත් නිසි කළමණාකරණයකින් යුතුව භාවිතා කරයි.

## IV. මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන කළමණාකරණය සහ පරිපාලන කුසලතා අත්පත් කර ගැනීමේ දී පහත සඳහන් හැකියා ප්‍රදර්ශනය කරයි.

- ❖ ජාතික හා පළාත් ප්‍රතිපත්ති / ප්‍රමිතීන්වලට අනුකූලව කටයුතු කරයි.
- ❖ දරුවන්ගේ මව, පියා, භාරකරුවන් පිළිබඳ පූර්ණ දැනුවත් බවකින් යුතුව කටයුතු කරයි.
- ❖ මව, පියා, භාරකරුවන් පිළිබඳ වාර්තාවක් පවත්වා ගනී.
- ❖ දරුවා මධ්‍යස්ථානයට පැමිණීම, පිටවීම පිළිබඳ අවබෝධයකින් කටයුතු කරයි.
- ❖ රථවාහන රියදුරන් හා භාරකරුවන් පිළිබඳ ලිපි ලේඛන හා වාර්තාවන් පවත්වාගෙන යයි.
- ❖ දරුවන් පාසලින් බැහැර යාමේ දී පිළිගත් ක්‍රමවේදයක් අනුගමනය කරයි.
- ❖ පෝෂ්‍යදායි ආහාරවේලක් දරුවන්ට ලබාදීම සහ වර්ධන සටහන් පොත් පවත්වාගෙන යාම සිදුකරයි.
- ❖ මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථානයේ සංවර්ධන සමිතිය, මුල් ළමාවිය සංවර්ධන අධිකාරිය අපේක්ෂිත මට්ටමට පවත්වාගෙන යයි. (මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථානවල දෙමාපියගේ සංවර්ධන සමිති පිහිටුවීමේ ව්‍යවස්ථා සංග්‍රහයට අදාළව)
- ❖ සහභාගීත්ව ප්‍රවේශය යටතේ පස් අවුරුදු/ එක් අවුරුදු සංවර්ධන සැලසුම් සකස් කර ඒ අනුව කටයුතු කරයි.
- ❖ මුල් ළමාවිය සංවර්ධන අධිකාරිය හා සෙසු රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතන සමග මනා සම්බන්ධතා ගොඩනගාගෙන කටයුතු කරයි.
- ❖ ඉගෙනුම් කව හා විෂය සමගාමී ක්‍රියාකාරකම් මනාව භාවිත කරමින් කටයුතු කරයි.

- ❖ මධ්‍යස්ථානයට අදාළ ලිපි ලේඛන සහ පොත්පත් මනාව පවත්වාගෙන යයි.
- ❖ විෂය සමගාමී හා විෂය පරිබාහිර කටයුතුවල දී දෙමාපියන් හා ප්‍රජාවගේ දායකත්වය ලබා ගනිමින් කටයුතු කරයි.
- ❖ පෙර පාසල් පෝෂක ප්‍රදේශය තුළ පෙරපාසල් නොයන ළමයින් පෙර පාසල් ගත කිරීම සඳහා ගත් ක්‍රියාමාර්ග.

# 3 භෞතික සංවර්ධන ප්‍රමිති

## 3.1 භූමිය හා පිහිටීම

1) මධ්‍යස්ථාන භූමි භාගය ස්වභාවික හා මිනිස් ක්‍රියාකාරකම් නිසා සිදුවන අනතුරුවලින් හා උපද්‍රවවලින් තොර වීම.

ස්වභාවික

භූමියෙහි පොකුණු, ඇළ, දොළ, වැව්, බැවුම්, වගුරු බිම්, නාය යන හා නාය යාමට ඉඩ ඇති ගල් පෙරළන බැවුම් සහිත ස්ථානයක්, කටුපඳුරු, හුඹස් (සර්පයන් සිටිය හැකි), විසකුරු සතුන් ගැවසෙන වන රොදවල් ආදියට ආසන්න ස්ථානයක නොවිය යුතුය.

මිනිස් ක්‍රියාකාරකම්

අධි විදුලි රැහැන්, ඉන්ධන පිරවුම්හල්, සම්ප්‍රේෂණ කුළුණු, විවෘත ළිං, හා රේල් පාර අසල ස්ථාන ආදියට ආසන්න නොවන ස්ථානයක් විය යුතුය.

2) ඌව පළාත් සභාවේ සම්මත කර ඇති පරිසර ප්‍රඥප්තියේ ප්‍රකාශිත පරිසර දූෂණකාරකයන්ගෙන් තොර විය යුතුය.

කර්මාන්ත ශාලා, ගල්මෝල්,වී මෝල්,ගල් වලවල්,කසල හා අපද්‍රව්‍ය බහාලන ස්ථාන, කසල ප්‍රතිචක්‍රීය කරන ස්ථානවලට මීටර් 500 ක් දුරින් පිහිටිය යුතුය. අධික රථවාහන ගමන් කරන ස්ථාන, සති පොළවල්, ගරාජ, මස්මාංශ වෙළඳසල්, අවමංගලශාලා, බස්නැවතුම්පොළවල්, අධික ජනගහනයක් ගැවසෙන ස්ථාන ආදිය මීටර් 200 ක් දුරකින් පිහිටිය යුතුවේ.

3) ළමා මනසට, චරිත සංවර්ධනයට හිතකර පරිසරයක් විය යුතුය. මත්පැන් ශාලා, සිනමා ශාලා, වීඩියෝ දර්ශන විකුණුම් ස්ථාන ශබ්ද පටිගත කිරීමේ වෙළඳසැල් ආදියෙන් මීටර් 250 කින් වත් දුරකින් පිහිටීම.

ඉහත කාරණා වලට අමතරව පහත සඳහන් ප්‍රමිතීන්ද සකස් කර ගත යුතුය.

- මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන ගොඩනැගිල්ලෙහි දොරටුව අනාරක්ෂිත ලෙස ප්‍රධාන පාරට මුහුණලා සකස් නොකළ යුතුය.

I. ප්‍රධාන මාර්ගයට මුහුණලා ඇති ඕනෑම භූමි සීමාවෙහි අඩි 2 ½ ක තාප්පයකින් හා අඩි 04 ක දැල් ආවරණයකින් යුක්ත වීම.

II. ගොඩනැගිල්ල පිහිටි භූමිය භූ විෂමතාවයන්ට අනුකූලව වැට සැකසීම කළ යුතුය.

III. මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන භූමිය මුළු භූමියෙන් 1/8 ක අවම ශාක ආවරණයකින් යුක්ත වීම. ( එහි එම ප්‍රදේශයට ආවේණික දරුවන්ට හිතකර පළතුරු, ඖෂධීය ශාක ආදිය තිබීම. )

IV. ඉගෙනුම් කව සහ එළිමහන් ක්‍රීඩා සඳහා ප්‍රමාණවත් ඉඩක් තිබිය යුතුය. (උදා - වැලි බිම, ජලපොකුණ, සංස්කෘතික කවය, පරිසර කවය, ගොඩනැංවීමට අදාළ උපකරණ හා සෙල්ලම් බඩු, වැඩ බිම, ඉගෙනුම් කවය, ජීවනකුසලතා කවය, පරිසර ගවේෂණ කවය)

## 3.2 ගොඩනැගිල්ල

1) ගොඩනැගිල්ල දරුවන්ගේ සෞඛ්‍ය ආරක්ෂාවට හිතකර විය යුතුය.
2) සෑම ගොඩනැගිල්ලක්ම ස්ථිර ගොඩනැගිල්ලක් විය යුතුය. ( වහල- උළු, හෝ තහඩු , / බිත්ති - ගඩොල් හෝ සිමෙන්ති ගල්, / බිම - සිමෙන්ති හෝ ගැළපෙන ටයිල් වර්ගයක්)

## 3.3 ඉඩකඩ :

1) ගුරු සිසු අනුපාතය 1:20 ක් හා විශේෂ අවශ්‍යතා සහිත ළමයින් සඳහා 1:5ක් විය යුතුය.
2) ගොඩනැගිල්ල එක් ළමයෙකු සඳහා වර්ග අඩි අවම වශයෙන් 10ක් හෝ ඊට වැඩි ප්‍රමාණයක් තිබිය යුතු අතර ගුරු සිසු සඳහා අවශ්‍ය වාතය ආලෝකය ලැබීම සඳහා මුළු වර්ග අඩි ප්‍රමාණයෙන් 1/7 ක් හෝ ඊට වැඩි ප්‍රමාණයක් වන සේ දොර ජනේල් හා වා කවුළු සැකසිය යුතුය.
3) සෑම ගොඩනැගිල්ලක ම ප්‍රවේශ මාර්ගය ආබාධ ළමයින් සඳහා ප්‍රවේශ විය හැකි අයුරින් සකසා තිබීම. (අධ්‍යාපන අමාත්‍යාංශය 2007-05-17 වන දිනැති අංක 2007/09 දරණ උපදෙස්, චක්‍රලේඛ හා බැඳේ.)
4) ගොඩනැගිල්ලේ බිත්තිය කොටබිත්ති නම් බිත්තිය මීටර 01ක් වත් උස් විය යුතු අතර වැසි සුළං හා දැඩි හිරු එළියෙන් ආරක්ෂා විය යුතුය.

I. සෑම මධ්‍යස්ථානයකම ප්‍රථමාධාර පෙට්ටියක් තිබිය යුතුය.( ප්‍රථමාධාර උපකරණ හා අනුමත බෙහෙත් ද්‍රව්‍ය සහිත විය යුතුවේ.)

II. ගොඩනැගිල්ල ඇතුළත හා පිටත දරුවන්ට ආකර්ශනීය සහ යෝග්‍ය වර්ණ හා චිත්‍ර භාවිතා කර තිබිය යුතු අතර බාහිර පරිසරය ද දරුවන්ට උචිත සේ සැකසී තිබිය යුතුය. (ගෙවත්තක්, මල්පාත්තිය, අපද්‍රවය ඉවත් කිරීමේ ක්‍රමවේදයක් හා ජලය බැසයාමේ ක්‍රමවේදයක් ආදී)

III. අපද්‍රවය වෙන් කර බැහැර කිරීම සිදු කළ යුතු වේ. ( කඩදාසි, දිරන නොදිරන ආදී ලෙස වෙන් කර තිබිය යුතු වේ.)

IV. ආගමික වතාවත් කිරීම සඳහා සුදුසු ස්ථානයක් තිබිය යුතුය.

V. දරුවන්ට ප්‍රමාණවත් මේස පුටු අනෙකුත් ඉගෙනුම් උපකරණ තිබිය යුතුය.

VI. ළමයෙකුගේ හදිසි අසනීප තත්ත්වයක දී භාවිතා කිරීමට ඇඳක් හෝ සුදුසු ස්ථානයක් පැවතීම.

VII. ළමයින්ගේ වර්ධනය මැන බැලීම සඳහා භාවිතා කරන උපකරණ කට්ටලයක් පැවතීම. (උදා -බර මැනීම සඳහා තරාදියක්)

VIII. පෙර පාසලේ ඵලදායිතාව ඉහළ නැංවීම සඳහා සුදුසු ක්‍රමවේදයක් සහ උපකරණ පැවතීම.

## 3.4 ජලය සහ සනීපාරක්ෂක පහසුකම්

ළමා ලේකම් කාර්යාලය, ළමා සංවර්ධන හා කාන්තා කටයුතු අමාත්‍යාංශය විසින් එළි දක්වන ලද ජලය හා සනීපාරක්ෂාව සම්බන්ධව ප්‍රමිතීන් ඌව පළාත් මුල් ළමාවිය සංවර්ධන අධිකාරිය මින් ඉදිරියට භාවිතා කරනු ලැබේ.

1. ළමයි 30 දෙනෙකු සඳහා වැසිකිලි 1ක් සහ කැසිකිළි 1ක් නිර්දේශිත අතර (ප්‍රදේශය අනුව) එක් ජල කරාමයකින් හෝ ජලය ලබාගැනීමට පහසුකම් තිබිය යුතුය. යම් ස්ථානයක ජල ගැටලු පවතීනම් බීමට සහ අනෙකුත් කටයුතු සඳහා සුදුසු පරිදි ජලය එක් රැස් කර තබා ගත යුතුය.

2. මෙම ජලය සහ සනීපාරක්ෂක පහසුකම් ළමයින්ට භාවිතා කළ හැකි උසකින් ආරක්ෂා සහිතව තිබිය යුතුය. කායික ආබාධ සහිත ළමයින්ගේ අවශ්‍යතා සඳහා ප්‍රවේශ පහසුකම් හා අනෙකුත් පහසුකම් පැවතිය යුතුය.

## 3.5 ළමා මේස, පුටු හා වෙනත් උපකරණ සැකසීමේදී අනුගමනය කළ යුතු ප්‍රමිතිය

### *I.* මේසය :

රවුම් නම් විශ්කම්භය අඩි 3, උස අඟල් 20 ක් තිබිය යුතුය.

හතරැස් නම් උස අඟල් 20, පළල අඩි 3දිග අඩි 03 තිබිය යුතුය.

### *II.* පුටුව :

කකුල්වල උස අඟල් 12, දිග අඩි 01, පළල අඩි 01ක් , ඇන්දේ උස අඟල් 24 ක් විය යුතුය.

### *III.* වෙනත් උපකරණ :

1) ළමුන්ට භාවිතයට ගත හැකි ලෙස බිත්ති කළු ලෑල්ලක් තිබිය යුතුය. (පොළවේ සිට අඟල් 18 සිට ඉහළට)
2) කළාල, බුමුතුරුණු, පැදුරු ප්‍රමාණවත් ලෙස තිබිය යුතුය.
3) දැන්වීම් පුවරුවක් තිබිය යුතුය.
4) සෞන්දර්යය උපකරණ ප්‍රමාණවත් ලෙස තිබීම.
5) ප්‍රමාණවත් ඉගෙනුම් උපකරණ තිබීම.

6) මුළුතැන්ගෙයක් සහ ඒ සඳහා කෝප්ප,ජොග්ගු, කෑම පිසීම සඳහා අවශ්‍ය භාජන හා ඒවා තැබීමට සුදුසු ස්ථානයක් තිබීම.

7) දරුවන්ට පරිහරණය හුරු කිරීම සඳහා කුඩා කොසු ,ඉදල්,පාපිසි, අත්පිස්නා, අපද්‍රව්‍ය බහාලන උපකරණ තිබිය යුතුය.

8) ළමා චිත්‍ර ආදී නිමැවුම් ප්‍රදර්ශනය සඳහා බිත්තියේ ප්‍රමාණවත් ඉඩක් හෝ පුවරු ලෙස ඉඩකඩ වෙන් කර තිබිය යුතුය.

9) දරුවන්ගේ වාර්තා, ක්‍රීඩා උපකරණ, පොත්පත් සහ වෙනත් ආරක්ෂා කළ යුතු දෑ සඳහා ගබඩා කාමරයක් හෝ වෙනත් පහසුකම් ( අල්මාරි, කබඩ්, රාක්ක ආදිය) තිබිය යුතු වේ.

10) ගොඩනැගිල්ලේ ඉඩකඩ අනුව දරුවාගේ බෝතල්, බෑග්, කුඩ ආදිය තැබීම සඳහා ප්‍රමාණවත් ඉඩක් වෙන් කළ යුතුය.
(එය ගුරුවරියගේ නිර්මාණශීලිත්වය අනුව අවශ්‍ය ඉඩකඩ භාවිත කළ හැකිය.)

## *IV.* සෙල්ලම් මිදුල

**සෙල්ලම් මිදුලක එකිනෙකට වෙනස් අංශ 7ක් ඇත. ඒ එක් අංශයක් යටතේ ළමයි ප්‍රමාණය අනුව සෙල්ලම් උපකරණ එකක් හෝ කිහිපයක් තිබිය යුතුය.**

**1) නැගීමට අදාළ ක්‍රියාකාරකම් :**

- කිතුලේ නැගීම
- කඳු නැගීම
- ඉනිමත් (පොල් කටු, ලී, ලැලි)
- කොටු දැල
- පිරමීඩ නැගීම
- අට්ටාල
- බංකරය
- ලිස්සන බෝට්ටුව

**2)** **රිංගිමට හා බඩ ගෑමට අදාළ ක්‍රියාකාරකම් :**

- පොලු ආරුක්කු මාර්ගය
- පැදුරු බිංගෙය / බැරල් බිංගෙය
- උමඟ සහ කාමර
- ටයර් උමඟ

**3)** **සමබරතාවයට අදාල ක්‍රියාකාරකම් :**

- ඒ දණ්ඩ
- ටයර් මත ඇවිදීම
- සංගිලි පාලම
- වැල් පාලම
- පොල් කටු ,බොරු කකුල්
- ඔංචිල්ලාව

**4)** **සැළසුම් ගත ක්‍රියාවලට අදාළ ක්‍රියාකාරකම් :**

- බට්ටා පැනීම
- වලකපු ගැසීම - නිසි ස්ථානයක සැකසීම

**5)** **ඇවිදීමට අදාළ ක්‍රියාකාරකම් :**

- අල්ලි මත ඇවිදීම
- නිදහස් ඇවිදීම
- පුවක් අරණේ ඇවිදීම
- රේල් පාර

**6) පැනීමට අදාළ ක්‍රියාකාරකම් :**

- වැලි ලිඳ

**7) විසි කිරීමට අදාළව :**

- බෝල විදිනය
- ඉලක්කයට ගැසීම

**8) වෙනත් :**

- සෙල්ලම් ගෙය
- සෙල්ලම් කඩය
- සෙල්ලම් අල්මාරිය

# ආශ්‍රිත ග්‍රන්ථ හා ලේඛන

1. ළමා ප්‍රමිති (ළමා ලේකම් කාර්යාලය, ළමා සංවර්ධන හා කාන්තා කටයුතු අමාත්‍යාංශය 2015/11/19 වන දින එළි දක්වන ලද Early childhood development standards for Sri Lankan children.)

2. ගුරු සංවර්ධන ප්‍රමිති (ගුරුවරුන්ගේ පාඨමාලා හා පුහුණුවීම් සම්බන්ධව ප්‍රමිතීන් සැකසීමේ දී 2014 අංක 02 දරණ මුල් ළමාවිය ප්‍රඥප්තිය භාවිතා කර ඇත.)

3. භෞතිකප්‍රමිති

   I. ළමා ලේකම් කාර්යාලය, ළමා සංවර්ධන හා කාන්තා කටයුතු අමාත්‍යාංශය 2006 වර්ෂයේ එළි දක්වන ලද "නිවැරදි ආරම්භයට ළමා සංවර්ධන මධ්‍යස්ථාන සඳහා ප්‍රමිතීන් "

   II. ළමා ලේකම් කාර්යාලය, ළමා සංවර්ධන හා කාන්තා කටයුතු අමාත්‍යාංශය 2016 වර්ෂයේ එළි දක්වනලද ජලය සනීපාරක්ෂාව හා ස්වස්තතාවය අදාළ ප්‍රමිතීන් ( Minimum standards and guidelines for water, sanitation and hygiene in preschools. )

   III. ආබාධ සහිත ළමුන් සඳහා ප්‍රමිතීන් සැකසීමේ දී අධ්‍යාපන අමාත්‍යාංශය 2007-05-17 වන දිනැති අංක 2007/09 දරණ චක්‍රලේඛය මේ සඳහා භාවිතා කරන ලදී.

   IV. සෙල්ලම් මිදුල - ළමා සංවර්ධන හා කාන්තා කටයුතු අමාත්‍යාංශය විසින් 2002.12.05 දින නිකුත් කොට ඇති "ළමාවියේ සිතට ගතට සුවය ගෙනෙන තැනකි." ග්‍රන්ථය භාවිතා කරන ලදී.

# මුල් ළමාවිය සංවර්ධන ප්‍රමිති සකස් කිරීමේ සම්පත් දායකත්ව නාම ලේඛනය

| අ.අ | සම්පත්දායකයාගේ නම | තනතුර | රාජකාරී ලිපිනය |
|---|---|---|---|
| 1. | ආනන්දසිරි ගොඩකන්ද මයා | නිසි බලධාරි | මුල් ළමාවිය සංවර්ධන අධිකාරිය, පිං අරාව, බදුල්ල |
| 2. | ඩබ්ලිව්.එම්.ජයන්තා ගුණවර්ධන මිය | විදුහල්පති | මුල් ළමාවිය සංවර්ධන අධිකාරිය, පිං අරාව, බදුල්ල |
| 3. | වයි.එම්. නිමල් සමරසිරි මයා | ව්‍යාපෘති නිලධාරි | කොට්ඨාස අධ්‍යාපන කාර්යාලය, සියඹලාණ්ඩුව |
| 4. | පී.ජී.කේ. දමයන්ති මිය | ව්‍යාපෘති නිලධාරි | කලාප අධ්‍යාපන කාර්යාලය, බණ්ඩාරවෙල |
| 5. | ජේ.ඊ. සුධීර රත්නායක මයා | දිස්ත්‍රික් මුල් ළමාවිය සංවර්ධන නිලධාරි | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, මොණරාගල |
| 6. | එච්.ඒ. ඉන්ද්‍රානි මිය | දිස්ත්‍රික් මුල් ළමාවිය සංවර්ධන නිලධාරි | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, බදුල්ල |

# මුල් ළමාවිය සංවර්ධන ප්‍රමිති සකස් කිරීමේ සහභාගීත්ව නාම ලේඛනය

| අ.අ | සම්පත්දායකයාගේ නම | තනතුර | රාජකාරී ලිපිනය |
|---|---|---|---|
| 1 | ජේ.වී. හර්ෂණී මිය | මුල් ළමාවිය සංවර්ධන සහකාර | ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, බුත්තල |
| 2 | වයි. එම්. නිමල් සමරසිරි මයා | ව්‍යාපෘති නිලධාරි | කොට්ඨාස අධ්‍යාපන කාර්යාලය, සියඹලාණ්ඩුව |
| 3 | ආර්.එම්. මංගල දේශප්‍රිය මයා | මුල් ළමාවිය සංවර්ධන සහකාර | ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, බඩල්කුඹුර |
| 4 | රූපිකා රංජනි මිය | පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිනි | සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාලය, පස්සර |
| 5 | ඒ.ජේ.එම්.නිරෝෂා දිල්හානි මිය | පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිනි | සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාලය, ලුණුගල |
| 6 | ආර්.එම්.නිලන්ති ප්‍රියදර්ශනි මිය | පෙර පාසල් ගුරු | ලිට්ල් බර්ඩ්ස් පෙරපාසල, බඩල්කුඹුර |
| 7 | ඩී.කේ.එම්. චම්පිකා සඳමාලි මිය | පෙර පාසල් ගුරු | ධම්මානන්ද සිහිනි පෙරපාසල, හිඳගොඩ, බදුල්ල |
| 8 | ඒ.එච්.ටී.අයි.කරුණාරත්න මිය | පෙර පාසල් ගුරු | ප්‍රාදේශීය සභා සමනළ පෙරපාසල, බදුල්ල |
| 9 | කේ.එස්.සමන් මයා | ව්‍යාපෘති නිලධාරි | කොට්ඨාස අධ්‍යාපන කාර්යාලය, බුත්තල |
| 10 | ජේ.ඊ. සුධීර රත්නායක මයා | දිස්ත්‍රික් මුල් ළමාවිය සංවර්ධන නිලධාරි | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, මොනරාගල |
| 11 | ඊ.ඒ.ගුණශීලී මිය | ගුරු උපදේශක | කොට්ඨාස අධ්‍යාපන කාර්යාලය, වැල්ලවාය |
| 12 | කේ.ඒ.එන්.අයි. සුදර්ශනී මිය | මුල් ළමාවිය සංවර්ධන සහකාර | ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, ලුණුගල |
| 13 | ඩී.එම්.නදීකා දිසානායක මිය | මුල් ළමාවිය සංවර්ධන සහකාර | ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, රිදීමාලියද්ද |
| 14 | කේ.ඩී.ඇසිලින් මිය | පෙර පාසල් ගුරු | ශ්‍රී විජයානන්ද පෙරපාසල, පුස්සැල්ලා කන්ද, පතනවත්ත |
| 15 | ඩී.එම්. මල්ලිකා  මිය | පෙර පාසල් ගුරු | අංක 215, 11 කණුව, බඩල්කුඹුර |
| 16 | ආර්.එම්. ඉන්ද්‍රාවතී මිය | ගුරු උපදේශක | කොට්ඨාස අධ්‍යාපන කාර්යාලය, ඇල්ල |
| 17 | ඒ.එම්.එච්.එම්. බණ්ඩාර මයා | ව්‍යාපෘති නිලධාරි | කොට්ඨාස අධ්‍යාපන කාර්යාලය, මඩුල්ල |
| 18 | එච්.එම්.චානක සුරංග මයා | මුල් ළමාවිය සංවර්ධන නිලධාරි | ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, මොනරාගල |
| 19 | පී.ජී.කේ.දමයන්ති මිය | ව්‍යාපෘති නිලධාරි | කලාප අධ්‍යාපන කාර්යාලය, බණ්ඩාරවෙල |

| | | | |
|---|---|---|---|
| 20 | ඩී.එම්.මල්කාන්ති මිය | මුල් ළමාවිය සංවර්ධන සහකාර | ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, බිබිල |
| 21 | පී.ශ්‍රී දේවි මිය | ගුරු උපදේශක | කොට්ඨාස අධ්‍යාපන කාර්යාලය, බදුල්ල |
| 22 | ඩී.එම්.නිශානි දර්ශිකා මිය | පෙර පාසල් ගුරු | මංගල, පැල්ගහතැන්න |
| 23 | ඒ.එම්.සුදර්ශනී ප්‍රියංගිකා මිය | පෙර පාසල් ගුරු | නියෝලියන් පෙරපාසල, අංක 91, ජයතිලක මාවත, හාලිඇල |
| 24 | හිරෝෂණී වික්‍රමසූරිය මිය | මුල් ළමාවිය සංවර්ධන සහකාර | ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, බණ්ඩාරවෙල |
| 25 | බී.ජී.චාන්දනී ශ්‍රීමති මිය | ළමා හිමිකම් ප්‍රවර්ධන නිලධාරිනි | ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, ඇල්ල |
| 26 | බී.එම්.මේනකා බස්නායක මිය | ළමා හිමිකම් ප්‍රවර්ධන නිලධාරිනි | ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, රිදීමාලියද්ද |
| 27 | එච්.ඒ. ඉන්ද්‍රානි මිය | මුල් ළමාවිය සංවර්ධන නිලධාරි | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, බදුල්ල |
| 28 | එස්.ඉන්ද්‍රරාජ් මයා | සෞඛ්‍ය කළමනාකරු | වැවිලි මානව සංවර්ධන භාරය , බදුල්ල |
| 29 | ආර්.ආර්.එච්.ධර්මසේන මයා | ප්‍රාදේශීය සමාජ සජීවි කාරක | වැවිලි මානව සංවර්ධන භාරය , බදුල්ල |
| 30 | ආර්.එම්.තිලකසිරි මයා | දිස්ත්‍රික් ළමා හිමිකම් ප්‍රවර්ධන නිලධාරි | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, මොනරාගල |
| 31 | පද්මසිරි ජයසිංහ මයා | ළමා හිමිකම් ප්‍රවර්ධන නිලධාරිනි | ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, ලුණුගල |
| 32 | එච්.ජී.ශිරාණි ගුණරත්න මිය | ළමා හිමිකම් ප්‍රවර්ධන නිලධාරිනි | ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, බිබිල |